**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි සඳහන් නියමයන්ට පටහැනිව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු අයිතමයන් 4 ක වටිනාකම නිවැරදිව ගලපා නොතිබීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.මිලියන 1045 ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැළපිය යුතු අයිතම 3 ක් නිවැරදිව ගලපා නොතිබීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය රු.මිලියන 8 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | විගණන වාර්තාවට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට කටයුතු කරන්නෙමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 ඡේදය ප්‍රකාරව රු.1,196,346,664 ක් වූ පූර්ව කාලපරිච්ඡේද ගැලපුම් අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශන යළි ප්‍රතිෂ්ඨාපනය කර දැක්වීමට කටයුතු නොකර සියලුම ගැලපීම් සමුච්චිත ලාභ ශේෂයට ගලපා තිබුණි. තවද ඉකුත් වර්ෂයට අදාල එකතුව රු.3,153,284 | විගණකාධිපති පෙන්වා දී ඇති පරිදි උපචිත වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගැළපීම් ඉදිරියේදී නිවැරදි කරන බවටත් අදාළ වියදම් සඳහා වෙන්කිරීම් කලින් සිදු කරන බවටත් දන්වා සිටිමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් වූ උපචිත වියදම්, උපචිත වියදම් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 88 ඡේදය ප්‍රකාරව සියළුම වත්කම් පංතිවලට අදාලව ඵලදායි ජීව කාලය හෝ ක්ෂය ප්‍රතිශතයන් මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කල යුතු වුවත්, ඉඩම් වැටවල්, ගොඩනැගිලි කොටස් කිරීම, කැණීමේ අමතර කොටස්, මෘදුකාංග හා උපාංග සහ පරිගණක හා උපාංග යන වත්කම් වෙනමම වත්කම් පන්තියක් ලෙස දේපල පිරියත හා උපකරණ සටහනෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේ වුවත් එම වත්කම් පංතිවලට අදාල ක්ෂය අනුපාතයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වාර්තාවේ දක්වා ඇති වත්කම් අදාල පන්ති වලට වෙන් කර ඵලදායී ජීවකාලය හා ක්ෂය ප්‍රතිශතය නිවැරදිව ඉදිරියේ දී දැක්වීමට කටයුතු කරන්නෙමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 ඡේදය ප්‍රකාරව සම්පුර්ණයෙන් ක්ෂය කර තිබුණද දැනට භාවිතයේ පවතින, ගත්මිල වටිනාකම රු.462,950,272 ක් වූ ජංගම නොවන වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | කාර්යාංශය මගින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරනු ලබන්නේ වසර කට වරක් 05 .වේඑයද මුළු වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය සිදු කරනු ලබන අතර ශුද්ධ අගය ශුන්‍ය වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය සිදු කරනු නොලබයි 2021 . වර්ෂයේදී ඉඩම්, ගොඩනැගිලි යන වත්කම් පංති ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු යොදා ඇත . | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදය ප්‍රකාරව ඉතිරි තොග වටිනාකම, ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන දෙකෙන් වඩා අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවද, තොග වල ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය, රු.32,115,617 ක් වූ එහි පිරිවැය වටිනාකම් මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් භාණ්ඩ සමීක්ෂණ කටයුතු කාර්යාංශය තුල සිදු කරගෙන යනු ලබන කාල සීමාව තුල රටේ උද්ගත වූ හදිසි කොරෝනා ආපදා තත්වය මත එය තාවකාලිකව නවතා දැමීමට සිදු විය. ඉදිරි වර්ෂයේදී වාර්ෂික තොග ගණනයන් සිදු කර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදන බව දන්වා සිටිමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39(අ) ඡේදය ප්‍රකාරව, රාජ්‍යභාග ආදායම හඳුනා ගැනීම සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු රු. මිලියන 1,602 ක් වූ රාජ්‍යභාග ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | කැණීම් බලපත්‍ර වලට අදාළව නිශ්පාදන පරිමාව බලපත්‍රලාභීන් විසින් නිකුත් කිරීමේ රෙගුලාසි වල 14 වන ආකෘති පත්‍රය සමඟ කාර්යංශය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම නිශ්පාදන පරිමාව ඇතුළත් ආකෘතිය කාර්යංශය වෙත | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලැබෙන තෙක් කාර්යංශයට වර්ෂයට අදාළ රාජ්‍ය භාග ප්‍රමාණය නිශ්චය කළ නොහැක . එම නිශ්පාදන පරිමාව නොදැන ලැබිය යුතු රාජ්‍ය භාග මුදල පුරෝකථනය කිරීමක් ද කළ නොහැක. මෙම ප්‍රායෝගික ගැටළුව හේතුවෙන් කාර්යංශයේ රාජ්‍ය භාගය පිළිබඳ උපචිත පදනමෙන් ගිණුම්ගත කිරීමට නොහැකි බව දන්වා සිටිමු. කෙසේ වුව ද මෙම ගැටළු ප්‍රායෝගිකව නිරාකරණය කිරීම පිළිබඳ සාකච්ඡා කරමින් සිටී. | |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව මූල්‍ය කල්බදු පදනම මත ලබාගෙන තිබුණු මෝටර් වාහන 10 කට අදාල අවම කල්බදු ගෙවීම් වටිනාකම වට්ටම් කර වර්තමාන අගය ගිණුම්ගත කරනු වෙනුවට වට්ටම් නොකරන ලද රු.102,600,000 ක් වූ වටිනාකම ගිණුම්ගත කර තිබුණි. තවද කල්බදු ණයහිමි ශේෂය ජංගම හා ජංගම නොවන වශයෙන් නිවැරදි ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 10 ක් ලබා ගැනීම ගිණුම් ගත කිරීම සිදුකිරීමේදී යම් නිවැරදි කිරීමක් සිදුකළ යුතු වේ නම් එය තවදුරටත් සොයා බලා කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඌ) | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩම මිලදී ගැනීමේ පිරිවැය වූ රු.28,000,000 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වශයෙන් වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට මුළු පිරිවැය වටිනාකම ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද, එම ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන් කිරීමටද කටයුතු කර නොතිබුණි. | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම යටතේ වෙන වෙනම හඳුනාගෙන අදාළ ක්ෂය වෙන්කිරීම් සඳහා ගැළපීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මහකනදරාව හා හක්මන සුනාමි මධ්‍යස්ථානවල ගොඩනැඟිලි පිළිවෙලින් රු.2,670,527 ක් හා රු.2,794,651 ක් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණද ඊට අදාළ ක්ෂය ගණනය කර ගිණුම්වල දක්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෙම වත්කම් ඉදිකළ දිනයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු | මීට වර්ෂ ගණනාවකට පෙර මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම් සිදු කර තිබිණි. අදාල එම ගිණුම් තුල පෙන්නුම් කරනු ලබන්නේ අදාල ඉඩම් සඳහා කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් බැවින් ඒවා ක්ෂය කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත් | අදාල ක්ෂය ගණනය කිරීම් කර ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව සොයා බලා යම්කිසි වරදක් ඇතොත් එය නිවැරදි කරන බව දන්වා සිටිමු. | |
| (ආ) | බදු බැඳියාවක් නොමැති අයිතම 4 ක් මත රු.6,662,408 ක් වූ විලම්භිත බදු වගකීමක් හඳුනාගැනීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආදායම් බදු වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණනය පෙන්වා දී ඇති පරිදි අදාල නිවැරදි කිරීම් සිදුකිරීමට සටහන් කර ගතිමු. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ අඩමාණ ණය වෙන්කිරීම් රු.5,097,526 ක් වෙළඳ ණය ගැතියන් හා ලැබිය යුතු අගයන්ගෙන් අඩුකර දක්වනු වෙනුවට, ණය හිමියන් සහ ගෙවිය යුතු අගයන් ලෙස වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී වෙන් කිරීම්, වෙළඳ හා ලැබිය යුතු අගයන්ගේ අඩුකර දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමු. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය . |
| (ඈ) | ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66 ක එනම්, රු.255,682,009 ක් වූ සමාගමේ මුළු ශුද්ධ වත්කම් වලින් රු.188,750,125 ක හිමිකමක් කාර්යාංශය සතු වුවද සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ඉදිරියට GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම සමඟ ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. ඒ සඳහා ගත යුතු මූලික පියවරක් ලෙස 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යන බව දන්වා සිටිමු. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රමිතයේ (6)27ප්‍රකාරව මුදල් නොවන අයිතම ලාභයට ගැළපීමේදි අදාල අයිතම වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් වත්කම් ප්‍රදානයක වාර්ෂික ක්‍රමක්ෂය ලෙස දැක්විය යුතු රු 3,276,493.ක වටිනාකම ක්‍රමක්ෂය ලෙස සඳහන් නොකර රු 106,782,013.වූ ක්ෂය තුල ඇතුලත් කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් වත්කම් පංතිය සඳහා රු.325,422 ක ගැලපුමක් (අඩු කිරීමක්) සිදුකර තිබු අතර ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයේ පැවති රු.325, 422 ක ලී බඩු උපකරණ අළුත්වැඩියා කර දුෂ්කර පාසලකට ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) දරන 33 අංක 1992 ව්‍යපතල් හා ඛනිජ ද පනත<br>10 ජනවාරි 1997 දරන 958 දිනැති අංක ය මගින් ගැසට්පත්‍ර (4)33 සංශෝධිතවැනි පතල් කැණීම් නියෝගය | පතල් නිෂ්පාදනවල නිශ්වය කල වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍යභාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාර්යයන් සම්බන්ධව කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ වනවිට රෙගුලාසි සංශෝධනය සඳහා කටයුතු කරමින් පවතී. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6.2(ඇ) වගන්තිය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ජුලි 05 දිනැති අංක 02/09/01/අමප/2018 දරන ලිපිය | පනත ප්‍රකාරව මාස ½ ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගෙවිය යුතු වුවත් සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගැනීම නිසා 2016 - 2019 කාලය තුල සේවයෙන් ඉවත් වූ සේවකයන් 21 කට රු.8,352,114 ක් වැඩිපුර ගෙවා තිබූ අතර පාරිතෝෂික ගෙවීම සඳහා සම්පූර්ණ මාසයක වැටුප මත පදනම්ව රු.159,753,034 ක් ප්‍රතිපාදනය කර තිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික ආපසු අයකර ගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2018 මැයි 10 දින දන්වා තිබුණ ද එම මුදල් ආපසු අයකරගෙනද නොතිබුණි. | කාර්යාංශය පාරිතෝෂික පනත ප්‍රකාරව කටයුතු කර ඇති අතර, ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව මඟින්ද තහවුරු කර ඇත. ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදුව නැති බැවින් අයකර ගැනීමක් කළ යුතුව නැත. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ජා වූ පරිදි මේ වන විට අදාළ සියලු අනුමැතීන් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 V වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යවරයා නිකුත් කල 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය | පතල් හා ඛනිජ නිස්සාරණයේදී සමුච්චිත ප්‍රදේශය හෙක්ටයාර 10 ඉක්මවා පොළොව මතුපිට පතල් කැණීම් සිදු නොකල යුතු වුවද ඊට පටහැනිව හෙක්ටයාර 18 ක ප්‍රදේශයක ඛනිජ වැලි කැණීම සඳහා අංක IML/A/HO/1623 දරන කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. | 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග නිකුත් කරන ලද්දේ 1993 නොවැම්බර් 26 දිනැති අංක 772/22 දරන ගැසට් පත්‍රය මඟිනි. එම ගැසට් පත්‍රය හා පනත නිකුත් වීමට පෙර සිට ලංකා ඛණිජ වැලි සමාගම විසින් යන්ත්‍රානුසාරයෙන් කැණීම් සිදුකරමින් පැවති අතර, එම ගැසට් පත්‍රය මඟින් එවකට | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යාන්ත්‍රිකව කැණීම් කරමින් සිටි බලපත්‍රලාභීන්ට 1994 අප්‍රේල් 26 දිනට ප්‍රථම කාර්මික කැණීම් කරමින් බලපත්‍ර යටතේ බලපත්‍ර ලබා ගැනීම සඳහා සහන කාලයක් ලබා දී තිබුණි. ඒ අනුව හෙක්ටයාර් 10 ක් ඉක්මවන ප්‍රදේශයක් සඳහා එවකට වසර 20 කට වඩා අධික කාලයක් පවත්වාගෙන ආ මෙම කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට නීතිමය බාධාවක් නොපැවතිණි. | |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි (1)365 | නියමිත මුදල් වර්ෂය තුල අනුදත් ගෙවීම සඳහා පමණක් අත්තිකාරම් ලබාදිය යුතු නමුත් වර්ෂ සිට වර්ෂ 1 ට වැඩි කාලය 5ක් ඉක්මවූ දේශීය මිලදී ගැනීම් සඳහා ලබාදී නොපියවී ඇති අත්තිකාරම් ශේෂ වටිනාකම රු 7,608,105.ක් විය . | මෙහි GPRS System සඳහා රු.1,927,810 ක මුදලක් ගෙවා ඇත. එහෙත් මෙම System එක සම්පූර්ණ කර නොමැති බැවින් වත්කම් ලෙස ගෙන නොමැත. Ewis Solution (Pvt) Ltd ආයතනය සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල ද එම ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති නිසා අත්තිකාරම් ගිණුමේ පෙන්නුම් කෙරේ. අනෙක් අත්තිකාරම් සඳහා අදාල අංශ වෙත අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපි නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ii) මුදල් රෙගුලාසි (5)371 | ලබාදෙන අත්තිකාරම් මුදල් වර්ෂයේ දෙසැම්බර් මාද දිනට වැඩියෙන් ප්‍ර 31 නොකල යුතු වුවත්වර්ෂට 5 සිට 1 වැඩි කාලයක් ඉක්මවූ නිලධාරීන්ට ලබාදී ඇති අත්තිකාරම් වලින් නොපියවූ ඇති ශේෂය රු 6,329,943. ක් විය. | විගණනය දක්වා ඇති පරිදි එක් නිලධාරියෙකුට ලබා දී ඇති අත්තිකාරම් මුදල ලෙස රු1,500,000. ක මුදලක් ලබා දී ඇති අතර එය වර්ෂ 05 කට වැඩි කාලයක් ගතවී ඇත. මේ සම්බන්ධව නීතිමය පියවර ගැනීම සඳහා යොමුකර ඇත. ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන්ට ලබා දී ඇති අත්තිකාරම් මුදලින් රු.4,091 ක් 1994 හා 1996 සිට පවතී ඒ හේතුවෙන් මෙම අත්තිකාරම් පොත් වලින් ඉවත් කිරීමටකටයුතු කර ඇති අතර රු260,000. මුදල මේ වනවිට පියවා ඇත. රු.1,047,822 මුදල අයකර ගැනීම සඳහා අදාල අංශ වෙත ලිපි යොමුකර ඇති බවද දන්වා සිටිමි . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 757(2) හා 507 (3) | පිරිවැය රු.1,208,686,416 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයට අදාලව සමීක්ෂණය කටයුතු සම්පූර්ණ කර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 වන දිනට කාර්යාංශයේ පවතින තොග වලට අදාලව තොග සමීක්ෂණයන් සිදු කොට අදාල වාර්තා මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි (3)702 | භූ කම්පන සහ සුනාමි නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ විද්‍යාගාර ගොඩනැගැල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මීට අදාලව පිටු 203 කින් සමන්විත ලේඛනයක් (කොන්ත්‍රාත් ගිවිසුම) ප්‍රසම්පාදන අංශය භාරයේ ඇත. එම ගිවිසුම විගණනයට පරීක්ෂාකර බැලීමේ හැකියාව ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ හා 31.11 වගන්ති 31.15 | සාපරාධී චෝදනා යටතේ 2017 අගෝස්තු 17 දින සිට වැඩ තහනමට ලක් කර තිබුණු කැණීම් ඉංජිනේරුවරයෙකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර තිබුණද වැඩ තහනම් කළ කාලසීමාවට අදාලව රු.954,521 ක අඩ වැටුප් හා රු.369,171 ක දිරිදීමනා හා ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. විනය පරීක්ෂණ නියෝගයක් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2019 අගෝස්තු 15 දින සිට එම නිලධාරිය නැවත සේවයේ පිහිටුවා තිබුණි. | මින් එක් නිලධාරියකු මෙම සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් වී ඇති අතර, අනෙක් නිලධාරියා සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණය මේවනවිට ද පැවැත්වේ. ඔහු වෙතින් කාර්යාංශයට අයවිය යුතුව ඇති මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු අතර අදාල මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුය . |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | 2019 හා 2018 ,2017 වර්ෂවල වාර්ෂික වාර්තා වන 30 ජුනි 2020 කර විටත් පාර්ලිමේන්තුවේ සභාගත .නොතිබුණි | 2017,2018 හා 2019 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ගරු අමාත්‍යතුමාගේ නිර්දේශය ලබාගැනීම සඳහා 2020 ජුනි 28 වන දින පරිසර අමාත්‍යාංශයේදී රැස්වීමක් පැවති අතර, අමාත්‍යාංශයෙන් දැනුම්දුන් පසු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට යැවීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (උ) | දිනැති 19 ල්ප්‍රේඅ 2002 දරන 14/1232 අංක නොවැම්බර් 2017 සහ දිනැති අංක 17 දරන අති 56/2045 විශේෂ ගැසට්පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝග | ශ්‍රී ලංකාව තුල පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශීය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය. නමුත් ශ්‍රී ලංකාව තුල මිනිරන් කැනීම් සිදු කරන බෝගල ග්‍රැපයිට් සමාගමේ මුළු කොටස් අයිතියෙන් සියයට 89.91 | 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ කණිනු ලබන ඛණිජ සඳහා ඛණිජවල අයිතිය වෙනුවෙන් රාජ්‍ය භාගය විකුණුම් මිලෙන් වර්තමානය වනවිට දේශීයව අලෙවි කරන්නේ නම් සියයට 6 ක්ද, අපනයනය කරන අවස්ථාවේ දී සියයට 7 ක්ද අයකරනු ලැබේ. | විදේශ විනිමය නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුය ,තවද . ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට |

| | | | |
|---|---|---|---|
| | ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. නමුත් මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි. | එලෙසම රාජ්‍ය භාග ප්‍රතිශතයන් කලින් කලට සංශෝධනය වී ඇති බව හා බලපත්‍ර මුද්‍රණයේදී නිවැරදි ප්‍රතිශතය ඇතුළත් කල නොමැති වුවද රාජ්‍ය භාග අයකිරීම නිවැරදිව සිදු වී ඇත. සිදුවී ඇති අතපසුවීම නැවත ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල අංශ වෙත උපදෙස් දී ඇත. ඉහත කී පනත හා රෙගුලාසි වලට අනුකූලව කාර්මික කැණීම් ඒ හා බී කාණ්ඩයේ බලපත්‍රලාභියෙකුට ඛණිජ අපනයනය සඳහා ඉල්ලීමට නීතිමය පසුබිම සැකසී ඇත. | එළඹ හෝ අනුමැතියක් නොමැතිව සමාගමකට කැණීම් බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.773,685,180 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.158,266,318 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.615,418,863 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අයකරගත් රාජ්‍යභාග භාණ්ඩාගාරයට සමාලෝචිත වර්ෂයේ ප්‍රේෂණය නොකිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

------------------------------------------------------------------------

| ආදායම් | 2020 | 2019 | ආදායම් වැඩි/අඩුවීමේ ප්‍රතිශතය | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| ආදායම් | 2,025,438,786 | 2,476,349,149 | (18) | කෝවිඩ් 19 වසංගතයේ බලපෑම් නිසා සමාලෝචිත වර්ෂයේ රාජ්‍යභාග ආදායම හා බලපත්‍ර ආදායම අඩුවීම |
| අනෙකුත් ආදායම් | 77,637,587 | 92,919,595 | (16) | කැණීම් අංශයේ අනෙකුත් ආදායම් අඩුවීම |
| <u>වියදම්</u> | | | | |
| මෙහෙයුම් වියදම් | 650,901,098 | 1,960,220,410 | (66) | සමාලෝචිත වර්ෂයේ රාජ්‍යභාග භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබීම නිසා |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | බෝගල ග්‍රැපයිට් සමාගම වෙත කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීම | **බෝගල ග්‍රැෆයිට් සමාගම වෙත කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීම** | |
| (i) | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ප්‍රකාශනයක් ලෙස 2018 වර්ෂයේදී නිකුත් කරන ලද "ආර්ථිකය සරිකල හැකි ලාංකීය ඛනිජ සම්පත්" නැමැති ග්‍රන්ථයේ සඳහන් ආකාරයට වර්තමානයේදී ශ්‍රී ලංකාවට නැනෝ තාක්ෂණය හඳුන්වාදී ඇති බවත් මෙම නැනෝ තාක්ෂණය තුලින් මිනිරන් සඳහා අපරිමිත වටිනාකමක් ලබා දිය හැකි බවත් එහි සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට නැනෝ තාක්ෂණය උපයෝගී කරගෙන සැකසූ ග්‍රැෆීන් ග්‍රෑම් 01 ක් රු.150,000 ක (කි.ග්‍රෑම්. 1 ක වටිනාකම රු.මි.150) තරම් ඉහල මිලක පවතින අතර සමාගම විසින් කැණීම් කරන මිනිරන් නිමි හෝ අර්ධ නිමි නිෂ්පාදනයක් බවට පත් නොකර අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අපනයනය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වෙමින් පැවතුණි. සමාගම මගින් 2017-2019 අගෝස්තු කාලය තුල කැණීම් කරන ලද මිනිරන් මෙ.ටො. 6,460.68 ක් අපනයනය කිරීමෙන් රු.මිලියන | මිනිරන් වල ඇති කාබන් ප්‍රතිශතය අනුව ඛණිජ වටිනාකම උච්චාවචනය වේ. ඒ අනුව කාබන් ප්‍රතිශතය සියයට 80 - 90, 90 - 95, 95 - 99 ආදී වශයෙන් අපනයනය කරන අතර, ඒවා අතුරින් කාබන් ප්‍රතිශතය සියයට 95 - 99 ඉහළ වටිනාකමක් ගනී. කාබන් ප්‍රතිශතය සියයට 80 - 90 වල මිළ පහළ අගයක් ගනී. ඒ අනුව අපනයනය කරන ඛණිජයේ කාබන් ප්‍රතිශතය අනුව වෙළඳපල මිල තීරණය වන අතර, ඒ අනුව කාබන්වල රාජ්‍ය භාගය අයකරනු ඇත.<br><br>ග්‍රැෆීන් සැකසීම සම්බන්ධයෙන් ලංකා නැනෝ තාක්ෂණ ආයතනය මේ වනවිට පර්යේෂණ කරමින් පවතී. ඉදිරියේදී මෙම නැනෝ තාක්ෂණය උපයෝගී කරගෙන ග්‍රැෆීන් නිෂ්පාදනය කරන්නේනම් එවැනි අවස්ථාවකදී මිළ ගණන් අනුව සිදුවන රාජ්‍ය භාගය ගණනය කරනු ඇත. | මිනිරන් ඉතා අඩු මුදලට අමුද්‍රව්‍යක් ලෙස අපනයනය කිරීම වෙනුවට නැනෝ තාක්ෂණය භාවිතා කර නිමි හෝ අර්ධ නිමි නිෂ්පාදනයන් සකස් කර අපනයනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 1,747.21 ක ආදායමක් ලබා තිබුණි. ඒ අනුව අගය එකතු කිරීමෙන් තොරව අමුද්‍රව්‍ය ලෙස මිනිරන් කිලෝ ග්‍රෑම් 01 ක් රු.270 ක් වූ ඉතා අඩු මිලකට අපනයනය කර ඒ මත රාජ්‍යභාග ගෙවා තිබූ අතර මෙම අපනයන මිල හා අමුද්‍රව්‍ය මිල අතර සියයට 55555556 ක තරම් අගය අහිමි වීමක් විය. | | |
| | (ii) මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල සමාගම වෙත වර්ෂයක කාලයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කරන අතර එය වසරින් වසර දීර්ඝ කරනු ලැබේ. ඊට අමතරව පුරා විද්‍යා දෙපාර්මේන්තුව විසින් ගලිගමුව ප්‍රාදේශිය ලේකම් වෙත අදාළ සමාගමට කැණීම් කිරීම සඳහා වාර්ෂිකව අළුත් කිරීමේ පදනම මත සිය නිර්දේශ ඉදිරිපත් කරන අතර ප්‍රාදේශීය ලේකම් විසින්ද කැණීම් බලපත්‍රය වර්ෂයකින් දීර්ඝ කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කරයි. ඒ අනුව කැණීම් බලපත්‍රයද වාර්ෂිකව අළුත් කල යුතු වුවත් සමාගම විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත කැණීම් බලපත්‍රයේ වළංගු කාල සීමාව 2018 නොවැම්බර් 02 සිට 2028 නොවැම්බර් 01 දක්වා වර්ෂ 10 කට දීර්ඝ කිරීම මතභේදයට තුඩු දී තිබුණි. | බෝගල ග්‍රැෆයිට් මිනිරන් සමාගමට අයත් මෙම කැනීම් බලපත්‍රය සතු ඉඩම ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමක් නොවන බැවින් කාර්යාංශයේ පනත හා රෙගුලාසි වලට යටත්ව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ ලබාගැනීම අත්‍යාවශ්‍ය නොවේ. තවද බෝගල මිනිරන් පතල වසර 100 කට වඩා පැරණි පතලක් බවද එම පතල අංක 1992 අංක 33 දරන පතල් ඛණිජ ද්‍රව්‍ය පනත පැමිණීමට පෙර සිට පැවති පතලක් බවද තවදුරටත් ප්‍රකාශ කරමි. | විවිධ ආයතනවල ඉල්ලීම් මත කැණීම් බලපත්‍ර වළංගු කාලය එකවර වසර ගණනාවකින් දීර්ඝ කිරීම් නොකල යුතුය . |
| (ආ) | 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම්දීම ප්‍රකාරව ඛණිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට විගණන දින දක්වා කටයුතු කර නොතිබුණි. | මේ වනවිට කාර්යාංශය ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර පරිසර අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | සකස් කල මෙම ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළුගල් කැණීම් ප්‍රමාණය හඳුනා ගැනීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් මෙතෙක් අනුගමනය කර නොතිබුණු අතර කළුගල් කැණීම සඳහා යොදා ගන්නා පුපුරන ද්‍රව්‍ය මෙන් දෙගුණයක් කැණීම් කළ කියුබ් ප්‍රමාණය ලෙස සලකා රාජ්‍යභාග අයකර ගනිමින් පැවතුණි. | කාර්යාංශය විසින් සත්‍ය වශයෙන් කැණීම් සඳහා යොදාගන්නා ප්‍රමාණයට සාපේක්ෂව භාවිතාකරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධව විශ්ලේෂණය කර පිළිගත හැකි ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇති අතර, ඒ ආශ්‍රයෙන් රාජ්‍ය භාගය ගණනය කිරීමට මේ වනවිට පියවර ගෙන ඇත. | විද්‍යාත්මක ක්‍රමවේදයක් ඉක්මනින් සකස් කිරීම කල යුතුය. |
| (ඈ) | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිත කල පස් කියුබ් 1,343,810 ක් වැලි කියුබ් 3397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රු.26,876,200 ක් සහ රු.543,490 ක් බැගින් වූ එකතුව රු.27,419,690 ක රාජ්‍යභාගය සමාලෝචිත වර්ෂය තුලද කොන්ත්‍රාත් සමාගමෙන් අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධව කාර්යාංශය විසින් අදාළ සමාගම වෙත වාරිමාර්ග දෙපාර්තමේන්තුවටද පිටපතක් සහිතව අදාල හිඟ රාජ්‍ය භාග මුදල් ගෙවන ලෙස ලිපි කිහිපයක් සහ සිහිකැඳවීමේ ලිපි ද මේවනවිට යවා ඇත. විගණනය පෙන්වාදී ඇති පරිදි මේ විනවිට අදාල මුදල් ගෙවීම සිදුකර නොමැත. | මෙම හිඟ මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28(4) වගන්තිය ප්‍රකාරව කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. අදාල විධිවිධානයට පටහැනිව 2019 දෙසැම්බර් 13 දිනැති අංක 19/විවිධ(064) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැලි, පස් හා මැටි ප්‍රවාහනය සඳහා 2019 දෙසැම්බර් 4 දින සිට 2020 මාර්තු 16 දක්වා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම නවතා දමා තිබුණි. එම ඛනිජ සඳහා රාජ්‍යභාගය ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේදී ගාස්තු අයකර ගනිමින් පැවති නමුත්, ප්‍රවාහන බලපත්‍ර අහෝසි කිරීමේදී කැනීම්කරුවන්ගෙන් රාජ්‍යභාග අයකර ගැනීමට විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | කාර්යාංශය විසින් බලපත්‍ර ලබාදෙනු ලබන්නේ කැණීම් ප්‍රමාණය නියාමනය කිරීමට වන අතර, වැලි වලට සාපේක්ෂව විශාල පරිමාණයෙන් කළු ගල් කැනීම් කළ නොහැකි අතර, බලපත්‍රයේ සඳහන් කර ඇති ප්‍රමාණයට ආසන්න ප්‍රමාණයක් වෙඩි දමා කණින ලබන හෙයින් කැණීම් බලපත්‍රය මගින් ප්‍රමාණාත්මක නියාමන කටයුතු සිදුවෙතැයි අපේක්ෂා කළ හැක. තවද 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත ප්‍රකාරව කළුගල් සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබාගත යුතු වුවත්, කළුගල් ප්‍රවාහන බලපත්‍ර ලබා දීමෙන් එම ඛණිජයේ විකුණුම් මිලට අහිතකර බලපෑමක් ඇතිවන බැවින්ද, කැණීම් බලපත්‍රය මගින් ප්‍රමාණාත්මකව නියාමන කටයුතු සිදුවන හෙයින්ද දැනට කාර්යාංශය විසින් කළුගල් සඳහා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු නොලබන අතර, ඒ සඳහා අවශ්‍යතාවක්ද පැන නැගී නොමැත.<br>කාර්යාංශයේ පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදීම රාජ්‍ය භාගය ගැනීමට කටයුතු යොදා ඇති නමුත් ප්‍රවාහන බලපත්‍ර නිකුත් නොකරන ලද කාලය සඳහා පසුව රාජ්‍ය භාගය අයකර ගැනීමට කටයුතු කර ඇති හෙයින් මෙහි සඳහන් කර ඇති කාරණය නිවැරදි නොවේ. | කළුගල් සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය. |
| (ඊ) | 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතේ 2(ඉ) වගන්තිය ප්‍රකාරව ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් | ඛණිජ වල අගය එකතු කිරිම යනු භූමියෙන් ලබාගනු ලබන ඛණිජ යම් කිසි වෙනස් තත්වයකට පත් කිරීමකි. ඒ අනුව පොළවෙන් ඛණිනු ලබන ඛණිජ ඒ ආකාරයෙන්ම වෙළඳපලට ඒම සිදුනොවේ. ඛණිජ වැලි මුහුදු වෙරළින් ලබාගෙන ඉල්මනයිට්, රුටයිල්, | කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා අගය එකතු කර |

| | | | |
|---|---|---|---|
| | හඳුන්වාදී නොතිබිණි. ඒ හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | සර්කෝන් ලෙස වෙන්කර ඒ අනුව වටිනාකම එකතු කිරීමක් සිදුවේ. තවද පොළවෙන් ලබාගන්නා මිනිරන් ඒ ආකාරයෙන්ම වෙළඳපලට ඒම සිදුනොවේ. එම ඛනිජ පිරිසැකසුම් කර ඒ අනුව අගය එකතුකිරීම සිදුවේ. එබැවින් කාර්යාංශය වගකීම වන්නේ ඉන් එහා ගිය අගය එකතු කිරීමකි. එනම් අවම වශයෙන් මෙම ඛනිජ අර්ධ වශයෙන් නිමිභාණ්ඩ බවට පත් කිරීමට කටයුතු කිරීමයි. මේ සම්බන්ධව අදාල ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී. | අපනයනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (උ) | කාර්යාංශය විසින් 2014 සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල අයකර තිබුණු රු.මිලියන 8488 ක රාජ්‍යභාග ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ ප්‍රතිපාදන අනුව කාර්යාංශය වියදම් පියවා ගත යුත්තේ උපයන ආදායමින්ය. එබැවින් සියළු රාජ්‍ය භාග මුදල් භාණ්ඩාගාරයට යැවීමට නීතිමය තත්වයක් කාර්යාංශයට නොමැත. කෙසේ වෙතත් කාර්යාංශය අතිරික්ත මුදල් වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට යවනු ලැබේ.<br>තවද 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ කොළඹ වරාය නගර ව්‍යාපෘතියෙන් ලද රාජ්‍ය භාග මුදල් කාරයාංශයේ වාර්ෂික රාජ්‍ය භාග අදායම තුල ඇතුළත් වේ. ඒ අනුව කොළඹ වරාය නගර ව්‍යාපෘතියෙන් ලද මුදල් පොත් තැබීම ගැලපුමක් ලෙස භාණ්ඩාගාරයට යැවූ මුදල් ලෙස සළකා ගිණුම් තබන ලදී. ඒ අනුව 2016 සිට 2018 වර්ෂය දක්වා ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත. | රාජ්‍යභාග ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොඩවැලි කැණීම සඳහා ලබාදුන් බලපත්‍ර 13 ක් පිළිබඳව කාර්යාංශයේ අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) විසින් සිදුකල පරීක්ෂාවේදී සියළුම බලපත්‍රවල සඳහන් කැණීම් ප්‍රදේශ, ගැඹුර ඉක්මවා කැණීම් කර ඇති බවත්, කාර්යාංශයට රාජ්‍යභාග ආදායම අඩුවෙන් අයව ඇති බවත්, බලපත්‍ර සඳහා අයකර ගන්නා බැංකු ඇපකර ප්‍රමාණවත් නොවන බැවින් එය ඉහල දැමිය යුතු බවටත් නිරීක්ෂණය කර තිබුණි. ඒ පිළිබඳව ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දිනය දක්වාම ගෙන නොතිබුණි. තවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ හා රත්නපුර දිස්ත්‍රික්කයේ බලපත්‍රය | විගණනය දක්වා ඇති පරිදි බැංකු ඇපකර ඉහළ නැංවීම සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අදාල අංශ වෙත උපදෙස් දී ඇත.<br><br>කැනීම් භූමි පුනරුත්තාපනය කිරීම සඳහා යන වියදමට ආසන්න මුදලක් බැංකු ඇපකරයක් ලෙස ලබා ගැනීමේ ක්‍රමවේදයක් දැනට සකස් කර ඇති අතර, නුදුරු දිනකදී එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ඇත.<br><br>මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල අංශ දැනුවත් කර ඇත. | කැණීම් භූමි පුනරුත්ථාපනය කිරීමට යන වියදමට ආසන්න මුදලක් බැංකු ඇපකර ලෙස අයකර ගත යුතුය. එමෙන්ම කැණීම් භූමි නිරන්තරව පරික්ෂා කර ඒවා කැණීම්කරු ලවා පුනරුත්ථාපනය කරවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යටතේ වැලි කැනීම් කල භූමි පුනරුත්ථාපනය කර නොතිබුණු අතර අනාරක්ෂිත වලවල් ජලයෙන් පිරී තිබුණි. වැලි කැණීම් කළ භූමිය පුනරුත්ථාපනයට ලබා ගන්නා ලද ඇපකරයට වඩා මුදලක් පුනරුත්ථාපනයට වැය වීම හේතුවෙන් එම ඇපකරය ලබා ගැනීමෙන් තොරව හා භූමි පුනරුත්ථාපනය කිරීමෙන් තොරව අතහැර දමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ආ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ සාදන ලද පස් කැණීම් සඳහා බලපත්‍ර දීමේ නියෝගයන්හි 33 වගන්තිය ප්‍රකාරව ලබාදී තිබුණු බලපත්‍ර 2 ක් යටතේ සිදුකර තිබුණු කැණීම් වලින් පස් කියුබ් 10,382 ක් වෙනුවෙන් රු.287,010 ක රාජ්‍ය භාග ආදායම හා දඩ මුදල් අයකරගෙන නොතිබුණි. බලපත්‍ර සීමාවෙන් ඔබ්බට පස් කියුබ් 2,201 ක අනවසරෙන් කැණීම් කර තිබුණි. එසේම කැණීම් බලපත්‍රවල සඳහන් කොන්දේසි 7 ක් සහ ගිවිසුම් කොන්දේසි 2 ක් කඩකර තිබුණද, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු නමුත් ඊට අදාළ රු. 600,000 ක බැංකු ඇපකරය නිදහස් කර තිබුණි. බලපත්‍රයේ කොන්දේසි අනුව, නායයාම් වළක්වා ගැනීම සඳහා ආනති ක්‍රම පවත්වාගෙන යාම, පාංශු ඛාදනය වැළැක්වීමට පියවර ගැනිම, ඉඩමේ මායිම වටා මීටර් 05 ක බිම් තීරුවක් කැණීමෙන් තොරව අත්හැරීම, කැණීම් කටයුතු සම්මත මෙට්‍රික් ග්‍රිඩ් සීමාව තුළ පවත්වාගෙන යාම හා කැණීම් සිදුකල ඉඩම පුනරුත්ථාපනය කිරීම සිදුකල යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | විගණනය දක්වා ඇති මෙම කරුණු සම්බන්ධව සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල අංශ දැනුවත් කරන ලදී. | අදාල හිඟ රාජ්‍යභාග සහ දඩ මුදල් අයකර ගත යුතු අතර කැණීම් භූමි පුනරුත්ථාපනය කිරීමට කටයුතු කල යුතුය. එමෙන්ම කැණීම් කොන්දේසි කඩ කිරිම පිළිබඳ කැණීම්කරුට එරෙහිව කටයුතු කල යුතුය. |
| (ඇ) | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ට අයත් ඉඩමක් විධිමත්ව පවරා ගැනිමකින් තොරව කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු.3,914,563 ක් හා රු.12,225,173 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල දීර්ඝ කාලයක් පවත්වාගෙන යන ලදී. මෙහිදී මහජන සේවාවන් වඩා ඵලදායිව සහ ක්‍රමවත්ව ලබාදීම සඳහා නාගරික කලාපය තුළ ඉඩකඩ | ඉදිරියේදී මෙවැනි ගොඩනැගිලි ඉදි කිරීමේදී ඉඩම විධිමත්ව පවරාගෙන ගොඩනැගිලි |

| | | |
|---|---|---|
| ක් වැයකර තිබුණි. | තිබීම අත්‍යවශ්‍ය වූ බැවින්, දිස්ත්‍රික් ලේකම් වෙතින් එම කාර්යාලයේ ඉඩ පහසුකම් කාර්යාංශය ඉල්ලා තිබුණි. එවැනි ඉඩ පහසුකම් නොමැති වීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමිය රජයේ ඉඩමක් බැවින් එහි කාර්යාලයක් ස්ථාපිත කර ගැනීමට ඇති වූ එකඟතාවයක් මත කටයුතු කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ ඇති වෙනත් රජයේ ආයතන කුලී ගෙවන පසුබිමක භූ විද්‍යා සමීක්ෂණ හ පතල් කාර්යාංශය කුලී නොගෙවා තම ගොඩනැගිල්ලක් රජයේ ඉඩමක පවත්වා ගැනීම ආර්ථික වශයෙන් වාසි ගෙන දෙන්නක් බැවින්ද මේ සඳහා එකඟ වී ඇත. මෙම ඉඩම දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල භූමියේ ඉඩමක් බැවින් පවරා ගැනීමක් සිදු කළ නොහැක. | ඉදිකිරිමට කටයුතු කල යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ 02 වන මහල රු.11,545,178 ක වියදමින් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ප්‍රකාරව තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක්ද නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව උපදේශකවරයෙකු මෙම ඉදිකිරීම් කාර්යය සඳහා පත්කර රු.579,995 ක මුදලක් ගෙවා තිබූ අතර අදාල උපදේශකවරයා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1(ආ) හි සඳහන් නියමයන්ට පටහැනිව මෙම කාර්ය සඳහා පත්කල තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙසටද පත්කර තිබුණි. | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය කුළී පදනම මත පවත්වාගෙන යාම අධික මුදලක් වැය වීම හේතුවෙන් කාර්යාංශයට අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ තිබූ ගොඩනැගිල්ලේ දෙවන මහල කඩිනමින් ඉදිකර අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ස්ථාපිත කිරීම කළමණාකාරිත්වයේ තීරණය විය. එහිදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් මුදලින් (කම්කරු කුලිය නොමැතිව) ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව එකඟවූ බැවින් ද, කාර්යය කඩිනමින් ඉටුකර ගැනීමේ හැකියා තිබෙන බැවින්ද, අදාල කොන්ත්‍රාත්තුව කාර්යාංශ අධ්‍යක්ෂ මන්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබාදෙන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) වාහන 51 ක් සඳහා රු.408,000 ක් වැයකර GPS Tracking System සවිකර තිබූ අතර මෙයට අදාල ඇස්තමේන්තු, අනුමැතිය, සැපයුම්කරු තෝරාගත් ආකාරය, අදාල කොන්ත්‍රාත් ගිවිසුම සහ මෙයට අදාල ගෙවීම් ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ලිපිගොනු ඉදිරියේදී ලබාදිමට කටයුතු කරනු ඇත. | අදාල ලිපිගොනු ඉක්මනින් විගණනය වෙත භාරදිය යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පිටකෝට්ටේ පිහිටි භූමියේ රු.585,147,480 ක වියදමින් භූ කම්පන සහ සුනාමි නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුනද ඊට අදාළ ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් සඳහා වැයවන රු.383,193,671 ක් සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර කොන්ත්‍රාත්තුවේ හදිසි අවශ්‍යතා සහ වෙනත් වැය සඳහා දැරිය යුතු එකතු වටිනාකම වූ රු.201,953,810 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ස්ථාපිත කර ඇති ඉඩමට අදාලව අංක 10/2859/527/001 හා 2011.12.08 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතිය ප්‍රකාරව පිටකෝට්ටේ, එපිටමුල්ල පාරේ, අංක 569 දරන ස්ථානයේ කාර්යාංශය ස්ථාපිත කර ඇති පර්චස් 205 ක බිම් ප්‍රමාණයට කාර්යාංශයේ නමට පවරා ගැනීමේ එකඟතාව මත කාර්යාංශය මුදල් ගෙවා ලබා ගන්නා ලදි. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 209 ක මුළු බිම් කොටසම පරිසර අමාත්‍යාංශයට පවරා දීමට කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අදාළ ඉඩම කාර්යාංශයේ නමට පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්ද ඉදිරිපත් කර ඇති අතර, එම එකඟතාව ලබා ගත් වහාම ඉඩම් කොමසාරිස් විසින් දැනට කාර්යාංශය ස්ථාපිත මෙම ඉඩම පවරා දීම සිදු කරනු ඇත.<br>මේ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය මඟින් කැබිනට් මණ්ඩලය වෙත අදාල ඉඩම් පැවරීම සම්බන්ධනේ අපගේ ඉල්ලීම යොමුකර ඇති නමුත් මේ වනතෙක් නීත්‍යානුකූල පැවරීමේ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකර නැත. ප්‍රසම්පාදන කමිටු තීරණය කිරීමේදී හා ඒ සඳහා පත් කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුව මත කටයුතු කලද කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී තේරී පත්වූ කොන්ත්‍රාත් වටිනාකමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.<br>මෙම ටෙන්ඩරය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ඇතුළු සියලු ප්‍රසම්පාදන කටයුතු රේඛීය අමාත්‍යාංශය හරහා සිදු වූ අතර එම කටයුතු ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදුව ඇත. එහිදී අදාළ වියදම් පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇති බව නිරීක්ෂණය කරමි. | ඉඩම නීත්‍යානුකූලව කාර්යාංශය වෙත පවරා ගැනිම ඉක්මනින් කල යුතුය. කොන්ත්‍රාත්තුවේ හදිසි අවශ්‍යතා සහ වෙනත් වැය සඳහා දැරිය යුතු රු.201953810 ක වියදම් දැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවද මාස 2 සිට වර්ෂ 09 ක් දක්වා කාලයක් ගතවී තිබුණු, කාර්මික කැණීම් බලපත්‍රලාභීන් 874 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.156,275,430 ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද, එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | 2009 අංක 66 දරණ පනතින් සංසෝධිත 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ඉදිරිපත් කර ඇති ප්‍රතිසංස්කරණ සැලැස්ම අනුව භූමිය කැණීම් කිරීමෙන් පසු පුනරුත්තාපනය කල යුතුය. ඒ සඳහා බැදීමක් වශයෙන් බැංකු ඇපකරයක් මත ගිවිසුමක් අත්සන් කරනු ලැබේ. නියමිත පරිදි පුනරුත්තාපනය කටයුතු සිදුනොකරන බලපත්‍රලාභින්ගේ බැංකු ඇපකර කාර්යංශය විසින් අත්පත් කරගනු ලබන අතර බලපත්‍රලාභින්ගේ කැණීම් කරනු ලබන වලවල් පුනරුත්තාපනය සඳහා යොදවා පුනරුත්තාපනය කිරීමට කාර්යංශය විසින් කටයුතු කරනු ලැබේ. පුනරුත්තාපනයෙන් අනතුරුව අදාල බැංකු ඇපකර මුදාහරිනු ලැබේ. තවද මෙය නියාමනය කිරීම සඳහා කාර්යාංශහය පතල් සුරක්ෂිතතා අංශයක් පිහිටුවා ඇත. | භූමි පුනරුත්ථාපන කටයුතු ඉක්මනින් සිදුකල යුතුය. |